සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ **Page Layout & Graphic Designs**
සාමන්ත තැන්නගේ Saamantha Tennege

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananda Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandra Eeriyagama
08 8331 2318

TAS
Anura Seneviratne
03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

සාහිත්‍ය කලාව ————

සාහිත්‍ය කලාව තුළින් මිනිසා පූර්ණත්වයෙන් හා මානව හිතවාදී භාවයෙන් පරිපූර්ණ කරන්නේය යන අදහස වචන වලට සීමා කරමින් රට පුරාම පොත් ප්‍රදර්ශන, පොත් මිල අඩුකිරීම්, සම්මන්ත්‍රණ පැවැත්වෙන තවත් සැපතැළිබරයක් එළැඹ තිබේ. සැබෑ වසරකටම වරක් සල්පිල් ප්‍රදර්ශන පැවැත්වීමෙන් පමණක් රටක සාහිත්‍ය කලාව දියුණු කළ හැකි යැයි සිතීම මුලාවකි. ඒ සඳහා දිගු කාලීන සැලසුමක් හා ඒ කටයුතු පවත්වාගෙන යාම සඳහා සුබ සාධන හා පහසුකම් සැපයීම මෙන්ම ඒ වෙනුවෙන් සුදුසු සමාජ පසුබිමක් ගොඩනැගීම රටක ආණ්ඩුව මෙන්ම සමාජය සතු වගකීමකි.

නිර්මාණකරුවන් ගොඩනැගීම යනු ඛේකරියක පෝරණුවකින් පාන් බාන්නාක් මෙන් කඩිමුඩියට කළ හැකි දෙයක් නොවේ. පාසල් විෂය ධාරාවෙන් සාහිත්‍ය විෂය කප්පාදුවට ලක් වී ඉකුත් වූ දශක දෙක තුනක කාලයකට පසු අපේ රටේ නව පරම්පරාවේ චින්තන තත්වය තක්සේරු කිරීමේදී සාහිත්‍යය අපෙන් ඈත් කිරීමේ කරුමයේ ප්‍රතිඵල කොතරම්ද යන්න වටහා ගැනීම අසීරු නොවේ. මේ ප්‍රවනතා මැද ද නිර්මාණකරනයේ යෙදෙන අපේ සාහිත්‍යකරුවන් මුහුණ දෙන කඩ ඉම් නම් කොපමණද? අවම වශයෙන් යමෙකුගේ නිර්මාණශීලීත්වයට තැනක් හෝ අවස්ථාවක් ලැබෙනුයේ නිර්මාණයේ තත්වය හෝ හැකියාව මත නොව වෙනත් ඊට අදාල නොවන පහිබාහිර හේතූන් මත වීම කෙතරම් ඛේදජනකද?

කවියෙන් ලේඛකයෙක් හෝ ඛ්‍යෑයෙ සැබෑ නිර්මාණකරුවෙක් යනු ස්වභාවික පරිසරය තුළ හෝ සමාජය තුළ ඇති අප දකින අසීට අරුමයක් සේ නොදැනෙන දේ තමන්ගේ මනසේ ඇති සෞන්දර්යාත්මක හැකියාව හා තාර්කික හැකියාව සමග එකට මුසු කොට ස්වභාවිකත්වයෙන් බඹ්බට ගිය සෞන්දර්ජාත්මක පිලිබිඹුවක් අප තුළ ගොඩනගන්නායි. ඒ දේ සමාජයට ග්‍රහණය කර ගැනීමට සලස්වන්නායි. මේ සඳහා ලබා ගත යුතු නිර්මාණශීලීත්වය සඳහා ප්‍රතිභාව මෙන්ම මනා පරිචයක්ද තිබිය යුතුය. පරිචය ලබා ගැනීමේ මුල් පියවරක් ලෙස සාහිත්‍ය විෂයයක් ලෙස අප වෙත ලං වෙයි. එබැවින් සාහිත්‍යය අපේ දරු පරම්පරාවෙන් දුරස් කිරීම යනු ජාතික අපරාධයක් වෙයි. සාහිත්‍ය රස විඳීනය උදෙසා අපේ දරුවන් හුරු කිරීම අද දවසේ අවශ්‍යතාවකි. සෞන්දර්යය නොහඳුන පරම්පරාවක් බිහි වීම වැළැක්වීම සඳහා ඇවැසි පියවර වහා ගැනීම රජයේ යුතු කම වෙයි.

'කරන්ට්' නොවැදී විදුලිය භාවිතය සහ

වාමාංශික මිථ්‍යාව

ප්‍රගීත් එක්නැලිගොඩ

ඉන්දියානු සාගරයේ මුතු ඇටය යයි සිතා හෝ ඉතිහාසය ගැන අපගේ ඇති අහංකාරකම බැලීමට හෝ ආයෝජකයෝ මෙහි පැමිණෙන්නේ නැත. බැහිමතුන් එනතෙක් ඇඟට පනින්නට බලා ඉන්නා කතරගම පුද බිමේ සිටිනා යාචකයන් මෙන් විදෙස් ආයෝජකයෙකු එන්නේ කොයි වෙලේදැයි කියා ඔහුව උලා කන්නට බලා ඉන්නා දේශපාලනඥයන් හා නිලධාරීන් දැනගත යුතු එක දෙයක් නම්. ආයෝජකයන් මෙහි එන්නේ වන්දනා ගමනක් නොවන බවයි.

ඛනිජ්‍ධන්ගත ගැටලු සාර්ථකව විසඳා ගන්නේ නැතිව රටකට ඉදිරියට යාමට නොහැකිය. එය තේරුම් ගත් ආසියානු නායකයෝ තම රටවල් දියුණුව කරා ගෙන යමින් ඒ රටවල්වල ජනතාවට සැප පහසුකම් ඇති සමාජයක් බිහි කළහ. තමන්ගේ හෝ තම පක්ෂයේ පැවැත්ම හෝ වාසිය ගැන සිතා සමස්ථ සමාජයටම අගතියක් ගෙන දෙන ගැටළු සමග සෙල්ලම් නොකළහ. කරුණු කාරණා ගැන හරියටම දැන නොසිටි ජනතාව ආරම්භයේදී ගැටලු විසඳන ක්‍රමයට විරෝධයක් දැක්වුවද ප්‍රතිඵල ලැබෙන විට තම නායකයන්ට ගෞරව කරන්නට වූහ. සිංගප්පූරුව - මැලේසියාව ඊට උදාහරණය

ශ්‍රී ලංකාවේ අප අපගේ ඇත හිට ඇති ඉදිරිග මන ගැන දියුණුවූ ආසියානුවන් මෙන් බැරෑරුම්ව සිතා නැත. කුමන අන්දමකින් හෝ වාර්ශික සිවිල් යුද්ධය ජය ගතහොත් හැමදේම හරියනු ඇතැයි පිළිගැනීමක් ලොකු කුඩා කවුරු අතරත් පැතිරී ඇත. නමුත් වාර්ශික ගැටලුව විසඳා ගන්නත් අපට දියුණු වූ ආසියානුවන් සමග හරි හරියට ගමන් කරන්නට නම් වහාම විසඳා ගතයුතු ගැටලු රැසක් අප හමුවේ තිබේ. එවන් ගැටලු අතර බල ශක්ති ගැටලුව ප්‍රධාන එකකි.

රටක් ගොඩ නැගීමේ කාර්යයේදී බලශක්තිය ප්‍රධාන සාධකයකි. 1917 දී සෝවියට් රුසියානු විප්ලවය ජය ගැනීමෙන් පසු න්‍යාය පත්‍රයේ විසඳිය යුතු පළමු ගැටලුව ලෙස ලෙනින් තෝරාගෙන තිබුණේ ද බලශක්තියයි. ශ්‍රී ලංකාවේ පාලකයින් ඉහළ ආර්ථික වර්ධනයක් ගැන නිතර කතා කරති. ළඟදීම විදේශ ආයෝජකයන් රංචු රංචු මෙහි එන බව කියති. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහළ තනතුරු දරන්නන් අපූරු ගණන් ඉලක්කම් අහුරු ගණනින් උඩ දැමුවද ආර්ථික වර්ධනය ඇති කිරීමට තිබෙන මූලික බාධා ඉවත් කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කොට නැත.

අසල්වැසි රටවල් වලට සාපේක්ෂව හෝ කලාපීය වශයෙන් සලකා බලන විට මිලෙන් අඩු බාධාවලින් තොර විදුලි බලය ලබා දෙන්නේ නැතිව මේ රටට ආයෝජකයන් කැඳවා ගන්නේ කෙසේද? පොද්ගලික ව්‍යවසායකයන් මෙහි පැමිණ මුදල් ආයෝජනය කොට අපගේ සංවර්ධන බර ඔවුන්ගේ උරමතට ගෙන ආර්ථික වර්ධනයක් ඇති කර දෙනු ඇතැයි බලාපොරොත්තු වන රටක් කලාපයේ පවතින වැඩිම මිලට හා අතොරක් නැති බාධා කිරීම් ඇතිව විදුලිය සැපයීමෙන් ආයෝජකයන් ගෙන්වා ගන්නේත් ඇති කරනවා යැයි කියන ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගන්නේත් කෙසේද?

ඉන්දියානු සාගරයේ මුතු ඇටය යයි සිතා හෝ ඉතිහාසය ගැන අපගේ ඇති අහංකාරකම බැලීමට හෝ ආයෝජකයෝ මෙහි පැමිණෙන්නේ නැත. බැහිමතුන් එනතෙක් ඇඟට පනින්නට බලා ඉන්නා කතරගම පුද බිමේ සිටිනා යාචකයන් මෙන් විදෙස් ආයෝජකයෙකු එන්නේ කොයි වෙලේදැයි කියා ඔහුව උලා කන්නට බලා ඉන්නා දේශපාලනඥයන් හා නිලධාරීන් දැනගත යුතු එක දෙයක් නම්. ආයෝජකයන් මෙහි එන්නේ වන්දනා ගමනක් නොවන බවයි. එමෙන්ම ඔවුන් මෙහි පැමිණෙනු ඇත්තේ කිසියම් මුදලක් ආයෝජනය කොට මේ කලාපයේ වෙනත් තැනක ලබනවාට වඩා වැඩි ලාභයක් ලබන්නට බවය. අපට යම් සංවර්ධනයක් අත් වන්නේ ඔවුන්ගේ ආයෝජනවල අතුරු ඵලයක් ලෙසයි. ඒ නිසා අප ඔවුනට අප රටතුළ අත් දකින්නට සිදුවන කරදර හා බාධක ඉවත් කිරීමට ප්‍රතිපත්තිමය වශයෙන් තීරණයක් ගත යුතුය.

බල ශක්තිය යනු අද ලෝකයේ ප්‍රධානතම නිෂ්පාදන සාධකයකි. දිනකට හත් - අටවරක් කඩා හැලෙන අධික මිලක් ගෙවා ලබා ගන්නා විදුලි බලයත් යොදවා යමක් නිපදවා ලෝකය සමග තරග කොට ලාභයක් ලබා ගත නොහැකි බව ස්ව ආර්ථිකය වෙනුවෙන්ම කල්පනා කරන නිලධාරීන් හා කැබිනට් ඇමැතිවරුන් දැන නොසිටියාට ආයෝජකයෝ දනිති. රාජ්‍ය මෙහෙයුම් ආයතන මගින් කරනු ලබන නිමක් නැති බාධාවලට අමතරව විදුලිය බලය සැපයීමේ ගැටලුව ආයෝජකයන් මෙහි නොපැමිණීමට ප්‍රධාන කොටම බලපාන හේතුවකි.

විදුලිය බලය නිපදවීම හා බෙදා හැරීම විදුලිබල මණ්ඩලය මගින් සිදු කිරීම අද වන විට බැරෑරුම් අර්බුදයකට ලක්වී ඇතත් එම

26 වන පිටුවට